## ව්‍යාපාර නාම ලියාපදිංචියේ දී පහත සඳහන් ලියවිලි ඉදිරිපත් කළ යුතුය

1. නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත
2. ග්‍රාම නිලධාරී වාර්තාව
3. ග්‍රාම නිලධාරී විසින් සහතික කරන ලද ජාතික හැඳුනුම්පතේ පිටපතක්
4. ජාතික හැඳුනුම්පත නොමැතිනම් වලංගු රියදුරු බලපත්‍රය හෝ විදේශ ගමන් බලපත්‍රය ඉදිරිපත් කරනවිට හැඳුනුම්පත නොමැති වූ බවට පොලිස් පැමිණිල්ල ඉදිරිපත් කල යුතුය.
5. ව්‍යාපාරික ස්ථානයේ අයිතිය තහවුරු කරනු ලබන ඔප්පුවෙහි/ බදු ඔප්පුවෙහි/ කුළී ගිවිසුමෙහි පිටපතක් ( ග්‍රාම නිලධාරී විසින් සහතික කර තිබිය යුතුයි)
6. වෙනත් අයෙකුට අයත් ස්ථානයක් නම් ඔප්පු පිටපත සමග කැමැත්ත ප්‍රකාශිත ලිපිය ( ග්‍රාම නිලධාරී මගින් සහතික කර තිබිය යුතුයි)
7. ඔප්පුව ජීවිත භුක්තිය මත පවරා ඇත්නම් ජීවිත භුක්තිකරුගේ/ ජීවිත භුක්තිකරුවන්ගේ කැමැත්ත ප්‍රකාශිත ලිපිය ( ග්‍රාම නිලධාරී මගින් සහතික කර තිබිය යුතුයි)
8. වෙළෙඳ බලපත්‍රය (අදාල නගර සභාව/ ප්‍රාදේශීය සභාව මගින් නිකුත් කරනු ලබන)
9. හවුල් ව්‍යාපාර ගිවිසුමක් ඇතොත් එහි පිටපතක්
10. කුමන හෝ ආකාරයේ ආහාර පානයක් සම්බන්ධයෙන් වූ ව්‍යාපාරයක් නම් මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ වාර්තාව
11. දැව ආශ්‍රිත ව්‍යාපාරයක් නම් කළුතර දිසා වන කාර්යාලයෙන් දැව ගබඩාවක් සඳහා අනුමැතිය ලබාගත් පසුව ව්‍යාපාර නාමය ලියාපදිංචි කල යුතු ය.
12. රූපලාවන්‍ය කටයුතු කොණ්ඩා කැපීමේ මධ්‍යස්ථාන සම්බන්ධ ව්‍යාපාරයක් නම් ඒ සම්බන්ධයෙන් පිළිගත් ආයතනයකින් ලබාගත් සහතික පිටපතක් සහ සෞඛ්‍ය නිර්දේශය ඉදිරිපත් කල යුතුය.
13. නවාතැන් පහසුකම් ලබාදීම සම්බන්ධයෙන් පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරයක් නම් වයස අවු. 18 අඩු වයසේ පසුවන අයට නවාතැන් පහසුකම් නොදෙන බවට දිවුරුම් ප්‍රකාශයක්
14. මැණික් හා ස්වර්ණාභරණ සම්බන්ධයෙන් ව්‍යාපාරයක් නම් මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ නිර්දේශය
15. ආරම්භක ප්‍රාග්ධන මුදල සනාථ කිරීම සඳහා ව්‍යාපාරිකයා විසින් සැකසූ විධිමත් දිවුරුම් ප්‍රකාශයක් ග්‍රාම නිලධාරී සහතික කර තිබිය යුතු ය.
16. උපදේශන හා වෘත්තීය සම්බන්ධ ව්‍යාපාර සඳහා ඒ සම්බන්ධ සහතික ඉදිරිපත් කල යුතු ය.
17. ව්‍යාපාරය මගින් පරිසරයට යම් හානිකර තත්ත්වයක් ඇතිවන්නේ නම් ලියාපදිංචියට පෙර පරිසර වාර්තාවක් ලබාගෙන එහි පිටපතක්ද ඉහත ලේඛන සමග ඉදිරිපත් කල යුතුය. (ගල් මෝල්, ලී මෝල්, සත්ව ගොවිපල, සේවා ස්ථාන, රසායනික ද්‍රව්‍ය, ප්ලාස්ටික් භාණ්ඩ)